**ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2015 වර්ෂය**

ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 758.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 601.42 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 156.58 ක් හෙවත් සියයට 21 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 543.70 | 538.22 | 5.48 | 01 |
| මූලධන | 214.30 | 63.20 | 151.10 | 70 |
| එකතුව | 758.00 | 601.42 | 156.58 | 21 |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 25 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු. මිලියන 1802.79 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ අතර එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු. මිලියන 1,652.95 ක් හා රු. මිලියන 92.03 කින් සමන්විත රු. මිලියන 1,744.98 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 55.80 කින් හා රු. මිලියන 2.01 කින් සමන්විත රු. මිලියන 57.81 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසන ලද ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 3 කින් හා සියයට 2 කින් නියෝජනය විය.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 36.58 | 31.326 | 18.00 | 27.62 | 100.00 | 94.83 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 7002/0000/00/0287/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 45,000 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක පොදු තැන්පත් ගිණුම් වල 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. 84,555,167 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6003/0000/00/0015/0000/000 | 563,838 |
| 6000/0000/00/0001/0074/000 | 2,429,973 |

| | |
|---|---|
| 6000/0000/00/0002/0098/000 | 13,000 |
| 6000/0000/00/0013/0066/000 | 2,167,977 |
| 6000/0000/00/0014/0010/000 | 11,067 |
| 6000/0000/00/0016/0049/000 | 79,245,598 |
| 6000/0000/00/0017/0017/000 | 122,414 |
| 6000/0000/00/0018/0058/000 | 1,300 |
| | ------------- |
| එකතුව | 84,555,167 |
| | ======== |

**2.4 විගණන නිරීක්ෂණය**

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත් කාලීන කර නොතිබුණි. |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත් කාලීන කර නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | යාවත් කාලීන කර නොතිබුණි. |
| (ඈ) | උපපත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | යාවත් කාලීන කර නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 150,000,000 ක් වූ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සලසන ලද සම්පූර්ණ ප්‍රතිපාදනය අදාළ කාර්ය සඳහා යොදා ගැනීමෙන් තොරව ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසන ලද ප්‍රතිපාදනය එකතුව රු. 11,339,000 ක් වූ අතර ඉන් රු. 2,921,453 ක් ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන් කරන ලද රු. 122,600,000 ක මුදලට අතිරේකව පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 119,300,000 ක මුදලක් ලබාගෙන තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 07 ක් සඳහා සලසන ලද රු. 113,550,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක් නියෝජනය වන රු. 20,570,000 ක මුදලක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් වලට මාරු කර තිබුණි.

**3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන**

**----------------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු. 124,084,039 ක මුදලක් ලැබී තිබුණද, ඉන් සියයට 83 ක් වන රු. 103,475,473 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

**-------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව, ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම එය ලබාගත් කාර්ය සම්පූර්ණ කළ වහාම නිරවුල් කළ යුතුය. කෙසේවුවද අවස්ථා 3 කදී නිලධාරීන් තිදෙනෙකුට ලබා දෙන ලද රු. 25,903 ක් වූ අතුරු අග්‍රිම දින 83 සිට දින 150 ක කාල පරාසයක ප්‍රමාදයක් සහිතව නිරවුල් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 373 ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට ප්‍රතිපූර්ණය කළ යුතු රු.45,000 ක අග්‍රිම ශේෂය දින 42 ක ප්‍රමාදයකින් පසුව 2016 පෙබරවාරි 11 දින ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

**------------------------**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ඉඩම් හිමියෙකුට වන්දි ගෙවීම සඳහා කෝරළේ පත්තු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු. 81,439 ක මුදලක් 2009 අප්‍රේල් 29 දින ලබා ගෙන තිබුණද ඉඩම් හිමියාට ගෙවීමෙන් තොරව එය පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

### 3.5.1 අභ්‍යන්තර විගණනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරීවරයෙකු හා අභ්‍යන්තර විගණන නිලධාරීන් 33 දෙනෙකු පත් කිරීම මඟින් අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 14 ක අභ්‍යන්තර විගණනයන් සිදු කිරීමේදී පහත සඳහන් වැදගත් කරුණු වලට අදාළව සම්පූර්ණ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

* කොන්ත්‍රාත් පරිපාලනය
* වත්කම් කළමනාකරණය
* වාහන නඩත්තු කිරීම
* අත්තිකාරම් ගෙවීම
* භෞතික කාර්යසාධනය

### 3.5.2 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් කළමනාකරණයට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලදී

**(අ) බාහිර පාර්ශවයන්ට ලබාදෙන ලද වත්කම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2006 මාර්තු 26 දිනැති අංක එච්ඒ/ඩීඒ/12/27 දරන ලිපිය අනුව, සියලුම ප්‍රාදේශීය ලේකම්වරු ඔවුන්ට වෙන් කරන ලද නිලනිවාස වල පදිංචි විය යුතු වුවත් පොරතිවුපත්තු ප්‍රාදේශීය ලේකම්වරයාට වෙන් කරන ලද නිලනිවාසය ලේකම්වරයා විසින් පදිංචි වීමෙන් තොරව 2014 අගෝස්තු 14 දින සිට වන ජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ලබා දී තිබුණි. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මෙම නිල නිවාසය ආපසු ලබාගෙන පදිංචි වීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේ සිට මඩකලපුව, ග්‍රීන් ස්ට්‍රීට් හි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල නිවාස 2 ක බාහිර පුද්ගලයින් පදිංචි වී තිබුණි. කෙසේ වුවද මෙම නිල නිවාස ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **නිරවුල් නොකළ බැරකම්**

**-----------------------------**

නෝර්ඩ් කාර්යාලය විසින් භාවිතා කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වෙනුවෙන් 2006 සිට 2013 වර්ෂය දක්වා මඩකලපුව, මහ නගර සභාවට ගෙවිය යුතු රු. 190,668 ක වරිපනම් බදු මේ දක්වා නිරවුල් කර නොතිබුණි.

**3.6 අනුකූල නොවීම**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවල යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ----------------------------- | ----------- | ----------------- |
| | | රු. | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මුදල් රෙගුලාසි 103 හා 104 | 898,092 | 2011, 2012 හා 2014 වර්ෂවලදී පොරතිවු පත්තු හා එරාවුර් පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන අනතුරුවලට භාජනය වී තිබූ අතර රු. 898,092 ක පාඩුවක් දරා තිබුණි. කෙසේවුවද, මේ සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 2009 දෙසැම්බර් 22 දිනැති අංක එච්ජ්ජීඑන්/4/2/1 දරන හා 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/199 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක ග්‍රාම නිලධාරීන් 251 දෙනෙකුගෙන්, රියැදුරන් 36 දෙනෙකුගෙන් හා වෙනත් රජයේ නිලධාරීන් 81 දෙනෙකුගෙන් ඇප තැන්පතු ලබා ගෙන නොතිබුණි. |

**3.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**-----------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළව සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂණ වලට අනුව පහත නිරීක්ෂණයන් කරන ලදී.

(අ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ දින 100 විශේෂ සංවර්ධන වැඩසටහන යටතේ කලවන්චිකුඩි ප්‍රදේශයේ බස් නැවතුම්පලක් ඉදිකිරීම සඳහා රු. 10,577,086 ක වටිනාකමට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* කොන්ත්‍රාත් කොන්දේසිවල 03 වගන්තිය ප්‍රකාරව, ඕනෑම අතිරේක කාර්යයක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේවුවද දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය නොමැතිව රු. 2,760,764 ක් වටිනා අතිරේක වැඩ සිදු කරගෙන ගෙවීම් කර තිබුණි.

* බස් නැවතුම්පලේ විදුලි පංකා 14 ක් පමණක් සවිකර තිබුණද, විදුලි පංකා 16 ක් සඳහා ගෙවීම් කර තිබුණි.

* මීටර් 70 ක් දිගට බස් නැවතුම්පල වටේ ආරක්ෂිත බැම්මක් ඉදිකර තිබුණි. කෙසේ වුවද මීටර් 73 ක් සඳහා ගෙවීම් කර තිබූ අතර රු. 19,800 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

* බස් නැවතුම්පල පිටුපස අත්තිවාරම කපරාරුවෙන් ආවරණය කර පස්වලින් පුරවා නොතිබුණද, එම වැඩ සඳහා ගෙවීම් කර තිබුණි.

* ස්ථානයට සුදුසු පරිදි අදාළ උසකින් බස් නැවතුම්පල ඉදිකර නොතිබූ බැවින් වර්ෂා කාලය තුළදී බස් නැවතුම්පල ජලයෙන් යටවන අතර එබැවින් වර්ෂා කාලයේදී මහජනතාවට බස් නැවතුම්පල භාවිතා කළ නොහැකිව තිබුණි.

(ආ) මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වටේ අගල අලංකරණය සඳහා කොන්ත්‍රාත්තුවක්, ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු. 3,611,385 ක පිරිවැයකට 2014 දෙසැම්බර් 19 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිරිනමා තිබුණි. 2015 ජූලි 31 දිනට වැඩ නිම කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* 2015 ජනවාරි 01 දිනැති ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුගේ ලිපිය අනුව, ප්‍රමාණ පත්‍රයේ සඳහන් වැඩ හැර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා ඔහුගේ අනුමැතිය ලබා ගත යුතුය. කොන්ත්‍රාත්කරු විසින් රු. 1,930,012 ක් වටිනා අතිරේක කාර්යයන් ඔහුගේ අනුමැතිය නොමැතිව සිදු කර තිබූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවීම් සිදුකර තිබුණි.

* ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත ඇස්තමේන්තු අනුව, අගලේ මඩ සහිත කොටස් පස් වලින් පිරවීම සඳහා ඝන අඩියකට රු. 1.472 ක රේටයකට ගෙවීම තීරණය කර තිබුණි. කෙසේවුවද, ඝන අඩි 155.20 කට රු. 5,000 ක රේටයට රු. 751,250 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.
* අගල අලංකරණය කිරීමේ වැඩ ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම මඟින් තාත්වික ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තුවේ ඇතුළත් කරන ලද වැඩ විෂයයන් 46 කින් වැඩ විෂයයන් 23 ක් කපාහැර ඒ වෙනුවට අතිරේක වැඩ විෂයයන් 11 ක් ඇතුළත් කර තිබුණි. එබැවින් මේ සම්බන්ධයෙන් පිළියෙල කරන ලද පිරිවැය ඇස්තමේන්තුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කර ගත නොහැකි විය.

(ඇ) ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශයේ දින 100 විශේෂ වැඩසටහන යටතේ, "දියවටුවන් ඔරලෝසු කණුව" වටරවුම ප්‍රදේශය අලංකරණය කිරීම සඳහා 2015 ජූලි 15 දින රු. 2,434,445 ක කොන්ත්‍රාත්තුවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* ඔරලෝසු කණුව වටේ වානේ පයිප්ප වලින් ඉදිකරන ලද වැටේ වට ප්‍රමාණය මීටර් 224.2 ක් පමණක් විය. කෙසේවුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මීටර් 235 ක වට ප්‍රමාණයක් සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබූ අතර ඒ අනුව කොන්ත්‍රාත්කරුට රු. 21,600 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි.

* රු. 300,000 ක වටිනාකමට මිලිමීටර් 150 කින් ගැඹුරකින් යුත් කුඩා ජල ටැංකි 2 ක් ඉදිකර තිබුණි. කෙසේවුවද මෙම ජල ටැංකි නඩත්තු කර නොතිබූ අතර මේ සඳහා දරන ලද වියදම ඵල රහිත වී තිබුණි.

(ඇ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ දින 100 විශේෂ වැඩ සටහන යටතේ ඔඩ්ඩමාවඩි ධීවර වරායේ ජෙටියක් ඉදි කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු. 3,000,000 ක වටිනාකමට 2015 ජූලි 13 දින කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබූ අතර 2015 නොවැම්බර් 26 දින එම කාර්යය නිම කර තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් 2016 පෙබරවාරි 23 දින සිදු කරන ලද භෞතික සත්‍යාපනය අනුව හා කාර්මික නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඝන මීටර් 177.49 ක යන්ත්‍ර වැඩ පමණක් සිදු කර තිබූ බව දැක්වුණි. කෙසේවුවද, ඝන මීටර් 231.90 ක යන්ත්‍ර වැඩ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු. 2,552,234 ක මුදලක් ගෙවා තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුට රු. 383,046 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

---------------------

විගණන නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් අවිධිමත් ගනුදෙනු අනාවරණය විය.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දිවිනැගුම ජාතික වැඩසටහන යටතේ මජ්මා නගර් හි කෘෂිකාර්මික ළිං 09 ක් ඉදිකිරීමට සමාලෝචිත වර්ෂය තුළ රු. 2,000,000 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මෙම කාර්යය නිම කර නොතිබුණද, වගකිව යුතු නිලධාරියා විසින් සම්පූර්ණ කාර්යයන් නිම කර ඇති බවට නිර්දේශ කර තිබූ අතර ඒ අනුව 2015 දෙසැම්බර් 31 දින රු. 1,926,851 ක චෙක්පතක් ලියා තිබුණි.

(ආ) කෝරළෙයි පත්තු - බටහිර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මජ්මා නගර් ග්‍රාමය සඳහා සූර්ය බල විදුලි පහන් 47 ක් සැපයීමට 2014 වර්ෂය තුළදී නැගෙනහිර උදානය වැඩ සටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් වෙන් කිරීමක් කර තිබූ අතර රු. 445,900 ක මුදලක් 2014 දෙසැම්බර් 10 දින ගෙවා තිබුණි. කෙසේවුවද, මෙම සූර්ය බල විදුලි පහන් 47 ලැබී තිබුණේ 2015 අප්‍රේල් 17 දිනදීය.

(ඇ) 2015 වර්ෂය සඳහා නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඔඩ්ඩමාවඩි ප්‍රාථමික විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. 500,000 ක මුදලක් කෝරළෙයි පත්තු - බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබූ අතර අනුමත සමිතියකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. කෙසේවුවද, කෝරළෙයි පත්තු - බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ සැලසුම් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත ප්‍රකාශනය මඟින්, ඉහත සඳහන් කාර්යය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද සමිතිය සහකාර අධ්‍යක්ෂ සැලසුම් විසින් පෞද්ගලිකව ක්‍රියාත්මක කරන ලද බවත්, එම වැඩ සඳහා ගෙවීම් ඔහු විසින් කරන ලද අවිධිමත් නිර්දේශයන් මත කරන ලද බවත් තහවුරු වී තිබුණි.

**3.9** **වංචනික ස්වරූපයේ ගනුදෙනු**

**---------------------------------**

විගණන නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් වංචනික ස්වරූපයේ ගනුදෙනු අනාවරණය විය.

(අ) 2011 වර්ෂය තුළදී උපකරණ හා ගවයින් සැපයීම මගින් දිළිඳු ජනතාවගේ ජීවනෝපායයන් වැඩිදියුණු කිරීම සඳහා "දිවිනැගුම" ජාතික වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් කෝරළෙයි පත්තු - බටහිර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු. 288, 222 ක මුදලක් සහන ද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා වැය කර තිබූ අතර අදාළ ප්‍රතිලාභීන් සඳහා නිකුත් කිරීමෙන් තොරව එම අයිතමයන් දිවිනැගුම නිලධාරීන් විසින් සාවද්‍යාව පරිහරණය කර තිබූ බව අදාළ ප්‍රතිලාභින්ගෙන් හා සමෘද්ධි නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද ලිඛිත ප්‍රකාශන මගින් තහවුරු වී තිබුණි.

(ආ) ඉහත වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 02 දෙනෙකු සඳහා හරිත නිවාස ඉදිකිරීම වෙනුවෙන් 2012 වර්ෂයේදී කෝරළෙයි පත්තු - දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. 160,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉහත ප්‍රතිපාදන වලින් ප්‍රතිලාභීන් දෙදෙනා වෙනුවෙන් ලියන ලද රු. 155,550 ක් වටිනා චෙක්පත් 06 ක් අදාළ ප්‍රතිලාභීන්ට භාර දීමෙන් තොරව දිවිනැගුම නිලධාරීන් විසින් වංචනිකව ලබා ගෙන ඇති බව දිවිනැගුම නිලධාරීන්ගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශනවලට අනුව තහවුරු විය.

**3.10** **කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ රෝහල් වලින් ලබා ගත් තොරතුරුවලට අනුව, 2016 වර්ෂය දක්වා ගැටුම් වලින් බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ සංඛ්‍යාව 1094 ක් විය. කෙසේවුවද රු. 13,752,184 ක පිරිවැයකට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ගැටුම් වලින් බලපෑමට ලක් වූ කාන්තාවන් සඳහා 2014 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් නිම කරන ලද ආරක්ෂිත නිවාස එම කාර්යය සඳහා මේ දක්වා යොදා ගෙන නොතිබුණි.

(ආ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සලසන ලද ප්‍රතිපාදන යටතේ මඩකලපුව, කලවියන්කාඩු හි රු. 9,588,068 ක පිරිවැයකට ඉදිකර 2014 වර්ෂයේදී නිම කරන ලද ළමාරක්ෂණ මධ්‍යස්ථානයක් අදාළ කාර්යය සඳහා මේ දක්වා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අදාළ ප්‍රතිලාභීන් සඳහා 1991 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 කට අදාළව අනුමත කර ගරු ජනාධිපතිතුමා විසින් ප්‍රදානය කරන ලද ස්වර්ණ භූමි, ජය භූමි හා වෙනත් ත්‍යාග ඔප්පු 1139 ක් භාරදීම සඳහා මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට රජයේ ඉඩම්වල නීති විරෝධී ලෙස විදුලි සංදේශ කුළුණු ඉදි කරන ලද ආයතන 27 කට එරෙහිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) කෝරළෙයි පත්තු මධ්‍යම හා මන්මුනෙයි උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් දිගුකාලීන බදු පදනම යටතේ පුද්ගලික ආයතන 2 කට ඉඩම් ලබා දී තිබුණි. එහෙත් අදාළ පුද්ගලික ආයතනවලින් රු. 3,830,000 ක වාරික හා බදු කුලී අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින් තිදෙනෙකු විසින් 2015 මාර්තු 10 දිනැති අංක 03/2014(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව, අනුමත සීමාවන් ඉක්මවා දුරකථන ඇමතුම් භාවිතා කර තිබුණු අතර අනුමත සීමාව ඉක්මවා ගෙවන ලද රු. 31,588 ක්වූ දුරකථන ගාස්තු අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 50 | 49 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 44 | 11 | 33 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 919 | 797 | 122 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 143 | 126 | 17 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 05 | - | 05 |
| | **එකතුව** | **1,156** | **988** | **173** | **05** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවා ගන්නා ලද අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.